# 13 කර්මය හා පුනර්භවය

අද පොසොන් පුර පසළොස්වක පෝය දිනය යි. කලින් නියම කරගත් පරිදි දහම් පාසලේ ළමයින් මෙන් ම ගුරුවරු ද සීල සමාදන වැඩසටහනට සහභාගි වූහ. එදා උදය වරුවේ භාවනා හා ධර්ම දේශනා වැඩ සටහන් පැවැත් වුණු අතර, දිවා දානයෙන් පසු ව යෙදී තිබුණේ ධර්ම සාකච්ඡාවයි. එයට පන්සලේ ලොකු හාමුදුරුවන් වහන්සේ ද වැඩම කළහ.

උන්වහන්සේ ධර්ම මන්දිරයට වැඩම කරන විට සිල් සමාදන් වූ දරුවන් අතර කර්මය සහ පුනර්භවය ගැන සාකච්ඡාවක් පැවතිණි. සියලු දෙනා නිශ්ශබ්ද වී නැගී සිට උන්වහන්සේට ගෞරව කළහ.

ලොකු හාමුදුරුවන් වහන්සේ ධර්මාසනයේ වැඩ සිට මා පැමිණෙන විට ඔය දරුවන් කතාකරමින් සිටියේ කුමක් ගැන දැ යි විමසූහ.

**සමන්ප්‍රිය** : හාමුදුරුවනේ අප මේ කතා කරමින් සිටියේ අප මැරිලා නැවත උපදින කොට අප කරපු දේවල් බලපානව ද ඒ බලපාන්නේ කොහොම ද කියන එක ගැන යි.

**ලොකු හාමුදුරුවන් වහන්සේ** : ඔය දරුවෝ ඒ පිළිබඳ ව මොනව ද කතා කළේ?

**නයනමාලී** : හාමුදුරුවනේ, ඊයේ අපි ඉස්කෝලේ ගිහින් එන කොට පාර අයිනේ බල්ලෙක් හිටියා. රුවන් ඌට ගලකින් ගැහුවා. අපි එපා කිව්වා ඇහුවෙත් නෑ. ඌ කකුලක් උස්සාගෙන කෑ ගසමින් දිව්වා.අපි කතා කළේ ඒක ගැන.

**ප්‍රදීපිකා** : හාමුදුරුවනේ, නයනමාලි කියනවා ඊළඟ ආත්මේ ඒ බල්ලා රුවන් වගේ ළමයෙක් වෙනවලු. රුවන් බල්ලකු වෙලා උපදිනවලු. ඊට පස්සේ ඒ ළමයා බල්ලට ගහනවලු. එතකොට ලබන ආත්මේ රුවන්ට බල්ලෙක් වෙලා ඒ ළමයගෙන් ගුටිකන්න වෙනවලු.

**සෙනුරි** : ලොකු හාමුදුරුවනේ ඒක එහෙම ම වෙන්නේ නැහැ නේ ද?

**ලොකු හාමුදුරුවන් වහන්සේ** : ඔය දරුවා කොහොම ද එහෙම ම නිගමනයකට බැස්සේ.

**සෙනුරි** : හාමුදුරුවනේ, අපි දවල් දනේ අරගෙන පන්සලේ හිටිය සතුන්ට කෑම දුන්නා. ඉතින් ඒක හොඳ කර්මයක් නේ. ඉතින් අපි ඊළඟ ආත්මේ සතුන් වෙලා ඉපදිලා ඉන්න කොට ඒ බල්ලො මිනිස්සු වෙලා ඇවිත් කෑම දෙන්නේ නැහැ නේ ද?

**ඉන්දික** : හාමුදුරුවනේ, හොඳ කරපු අයට එහෙම වෙන්නේ නැහැ නේ ද? එහෙම වෙන්නේ නරක කරපු අයට විතරයි නේ ද?

**ලොකු හාමුදුරුවන් වහන්සේ** : දරුවනේ, අපි හැමකෙනෙක් ම මේ සංසාරේ මැරි මැරි උපදිනවා. ඒ උපදිනකොට අපි පෙර කරන ලද කර්ම සහ මේ භවයේ කරන ලද කර්මයන්ගේ විපාක විඳින්නට සිදු වෙනවා.

එතකොට අර දරුවා බල්ලකුට ගැහුව නිසා, ඊළඟ භවයේ බල්ලකු වෙලා දුක් විඳින්න වෙනවා කියලා වත්, බත් දුන්න නිසා ඊළඟ භවයේ බත් ම ලැබෙනවා කියලා වත් කියන්න අමාරු යි. හැබැයි මතක තියාගන්න ඕන, අපි කරන හොඳ නරක කර්මවල විපාක විඳින්න වෙනවා. අපි නැවත උපදිනවා.

**මානෙල්** : හාමුදුරුවනේ, නැවත උපදිනවා කියන එකට නේ ද පුනර්භවය කියලා කියන්නේ?

**ලොකු හාමුදුරුවන් වහන්සේ:** අන්න හරි දරුවා, අපි නැවත උපදිනවා කියන කාරණය පිළිබඳ ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන ගැනීමට හැකි ඥාන දෙකක් සඳහන් වෙනවා.

1. පුබ්බේ නිවාසානුස්සති ඥානය හෙවත් පෙර ආත්මභාවය දැකීමේ නුවණ
2. චුතූපපාත ඥානය හෙවත් සත්ත්වයා සසර මැරෙන උපදින අයුරු දකින නුවණ

ඉහත සඳහන් ඥාන දෙකින් යුක්ත පුද්ගලයා සැකයක් නැතිව ම පුනර්භවය පිළිගන්නවා. මේ හැරුණුවිට අද විද්‍යාත්මක පරීක්ෂණ තුළින් ද මේ බව තහවුරු කර තිබෙනවා. නැවත නැවත මේ සසරේ මැරි මැරි උපදින ක්‍රියාවලිය නතර කිරීමට නම්, රහත් විය යුතු යි. රහත් වන තුරු ම අපට නැවත උපතක්, එනම් පුනර්භවයක් තිබෙනවා.

පුනර්භවයක් තිබෙන නිසා අපි හොඳ කර්ම කිරීමට පුරුදු වෙන්න ඕනෑ. අන් අයට කරදරයක් නොවන ආකාරයට ධාර්මික ජීවිතයක් ගෙවන්න කවුරුත් වග බලා ගන්න ඕන.

**සමන්ප්‍රිය** : ලොකු හාමුදුරුවනේ, එතකොට ඔය ඔක්කොම වෙන්නේ අපි කරපු කර්මයන් නිසා ද?

**ලොකු හාමුදුරුවන් වහන්සේ** : දරුවනේ, අපි කරන, කියන හැම දේම කර්මය වෙන්නෙත් නෑ, අපට සිදු වන හැම දෙයක් ම කර්මය නිසා සිදු වෙන්නෙත් නැහැ. අපේ බුදුහාමුදුරුවන් වහන්සේ කර්මය පිළිබඳ ව විස්තර කරල තියෙන්නේ මෙහෙම යි.

''චේතනා හං භික්ඛවේ කම්මං වදාමි
චේතයිත්වා කම්මං කරොති, කායෙන වාචාය මනසා''

---

මහණෙනි, මම චේතනාව කර්මය යැයි කියමි.
සිතින් සිතා, කයෙන්, වචනයෙන්, මනසින් කර්ම සිදු කරයි.

**නයනමාලී** : එතකොට හාමුදුරුවනේ අපි හිතිනුත් කර්ම කරනවා ද?

**ලොකු හාමුදුරුවන් වහන්සේ** : ඔව්. බොහොම හොඳ ප්‍රශ්නයක්. අපි කරන කර්ම ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදෙනවා. එම කොටස් දෙක නැවත සිත, කය, වචනය යන තුන්දෙර අනුව කොටස් වෙනවා.

1 කුසල කර්ම
2 අකුසල කර්ම

**කුසල කර්ම**
සිතින් සිදු වන කුසල කර්ම
කයින් සිදු වන කුසල කර්ම
වචනයෙන් සිදු වන කුසල කර්ම

**අකුසල කර්ම**
සිතින් සිදු වන අකුසල කර්ම
කයින් සිදු වන අකුසල කර්ම
වචනයෙන් සිදු වන අකුසල කර්ම


**විමංසා ගුරුතුමිය** : ස්වාමීන් වහන්ස, චුල්ලකම්මවිභංග සූත්‍රයෙන් කියවෙන්නේ කර්ම විපාක පිළිබඳ ව නේ ද?

**ලොකු හාමුදුරුවන් වහන්සේ** : ඔව්, ඔව්, චුල්ලකම්මවිභංග සූත්‍රය කර්ම හා විපාක පිළිබඳ ව හොඳින් විස්තර දැක්වෙන සූත්‍ර දේශනාවක්.

දිනක් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩසිටින විට **තෝදෙය්‍ය** බ්‍රාහ්මණයාගේ **සුභ** නම් තරුණ පුතා ඇවිත් බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ විමසුවා.

බුදුරජාණන් වහන්ස, සමාජයේ මිනිස්සු

| | |
|---|---|
| 1. අඩු වයසින් මිය යති. | 2. දීර්ඝායුෂ විඳිති. |
| 3. බොහෝ ආබාධ ඇති අය වෙති. | 4. ආබාධ අඩු අය වෙති. |
| 5. අවලස්සන අය වෙති. | 6. ලස්සන අය වෙති. |
| 7. තේජසින් අඩු අය වෙති. | 8. තේජසින් වැඩි අය වෙති. |
| 9. දුප්පත් අය වෙති. | 10. පොහොසත් අය වෙති. |
| 11. පහත් යැයි සම්මත අය වෙති. | 12. උසස් යැයි සම්මත අය වෙති. |
| 13. අනුවණ ව උපදිති. | 14. නුවණැති ව උපදිති. |



මෙසේ මිනිසුන් ගේ විවිධත්වයට හේතුව කුමක් ද? එහෙම යි ඇසුවේ.

ඉතින් දරුවනේ, මේ අවස්ථාවේ දී බුදුරජාණන් වහන්සේ මෙසේ වීමට හේතුව පෙර කරන ලද කුසල අකුසල කර්ම බව දේශනා කළා. එහෙත් මේ කාරණය පැහැදිලි මදි කියා සුභ මානවකයා එය විස්තර කර දෙන ලෙස බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියා. උන්වහන්සේ මෙ සේ එය පැහැදිලි කර දුන්නා.

| | | | |
|---|---|---|---|
| 01. | ප්‍රාණඝාතය කරන්නා | → | අඩු වයසින් මිය යයි. |
| 02. | ප්‍රාණඝාතය නොකරන්නා | → | දීර්ඝායුෂ විඳියි. |
| 03. | සතුන්ට තාඩන පීඩන කරන්නා | → | රෝගී වේ. |
| 04. | සතුන්ට තාඩන පීඩන නොකරන්නා | → | නිරෝගී වේ. |
| 05. | කිපෙනසුලු තැනැත්තා | → | සෝභා සම්පන්න ව නූපදී. |
| 06. | නොකිපෙන තැනැත්තා | → | සෝභා සම්පන්න වේ. |
| 07. | අනුන් සතු සැපතට ඊර්ෂ්‍යා කරන්නා | → | තේජස් නැත්තෙක් වේ. |
| 08. | අනුන් සතු සැපතට ඊර්ෂ්‍යා නොකරන්නා | → | තේජස් ඇත්තෙක් වේ. |
| 09. | මසුරු තැනැත්තා | → | දිළින්දෙක් වේ. |
| 10. | නොමසුරු තැනැත්තා | → | පොහොසතෙක් වේ. |
| 11. | උතුමන්ට ගරු නොකරන තැනැත්තා | → | පහත් අයෙක් වේ. |
| 12. | උතුමන්ට ගරුකරන තැනැත්තා | → | උසස් අයෙක් වේ. |
| 13. | හොඳ නරක නොවිමසන්නා | → | අනුවණයෙක් වෙයි. |
| 14. | හොඳ නරක විමසන්නා | → | නුවණැත්තෙක් වෙයි. |

මානෙල් : එතකොට ලොකු හාමුදුරුවනේ ජීවිතයේ හැමදෙයක් ම සිදු වන්නේ පෙර කර්මයෙන් ම ද?

ලොකු හාමුදුරුවන් වහන්සේ : නැහැ දරුවා, එහෙම වෙන්නේ නැහැ. මම අර කලින් මතක් කළා වගේ කර්මය හැම දෙයකට ම බලපාන්නේ නැහැ. හැබැයි අතීත කර්ම බලපාන අවස්ථා තිබෙනවා.

කාන්ති : හාමුදුරුවනේ එතකොට අපි හැම දෙනෙක් ම නැවත උපදිනවා. හොඳින් ඉන්න නම් හොඳ වැඩ කරන්න ඕනෑ නේ ද?



සතකුට වද දීම



අබ්බගාත කෙනකු



යාචකයකු නෑවීම



පොහොසත් කෙනකු

ලොකු හාමුදුරුවන් වහන්සේ : අන්න හරි ළමයා අපට මී ළඟ උපතක් තියෙනවා. අපි සසරේ මැරී මැරී උපදිනවා. බෞද්ධයන් වන අපි පුනර්භවය පිළිගන්නවා. එම නිසා නිතර නිතර කුසල කර්ම කිරීමට පුරුදු පුහුණු විය යුතු යි. අකුසල කර්ම කිරීම අත් හළ යුතු යි.

ලොකු හාමුදුරුවන් වහන්සේ ධර්ම සාකච්ඡාව අවසන් කරල අපට, ලෝවැඩ සඟරාවේ කවියක් ද කියා දී විහාරයට වැඩම කළා. දහම්පාසලේ ළමයින් කර්මය හා පුනර්භවය පිළිබඳ ව තිබූ වැරැදි වැටැහීම් දුරුකර ගත්තා. සියලු දෙනා ම සසර දුක් විඳින්න අකැමැති අය. ඒ නිසා අකුසල කර්ම නොකර ඉන්න ඕනෑ. සැප විඳින්න අපි කවුරුත් කැමැති යි. ඒ නිසා කුසල කර්ම කරන්න ඕනෑ.

පස් පව් කොට මෙතැනත් ලැබ සෝකය
ගොස් නිරයේ දුක් විඳිති අනේකය
රැස්කොට ඉන් පින් මෙ මිනිස් ලෝකය
හිස් නොකරව් කලෙකින් ලත් මේ කය

(ලෝවැඩ සඟරාව)

## සාරාංශය

සිත, කය, වචනය යන තුන් දෙරින් සිදුකරනු ලබන හොඳ, නරක ක්‍රියාවන් කර්මය ලෙස හැඳින්විය හැකි ය. මෙම ක්‍රියාවන්ගේ හෙවත් කර්මයන්හි යහපත් හෝ අයහපත් ප්‍රතිඵල මෙලොව දී හෝ පරලොව දී විඳීමට සිදු වේ.

බුදුදහමට අනුව අපට පුනරුත්පත්තියක් ඇත. එ නිසා අප යහපත් කර්ම එනම් කුසල කර්ම කළ යුතු ය. මෙලොව දී අප විඳින සැප සම්පත් හා දුක් කම්කටොළු බොහොමයක් සඳහා බලපා ඇත්තේ පූර්ව කර්ම බව ද අමතක නොකළ යුතු ය. ඒ අනුව සලකා බලා අපි මෙලොව හා පරලොව යන දෙලොව දියුණුව පිණිස යහපත් කර්ම හෙවත් කුසල කර්ම කිරීමට අදිටන් කර ගනිමු.

## ක්‍රියාකාරකම්

01. චේතනා හං භික්ඛවේ කම්මං වදාමි ...................... පැහැදිලි කරන්න.

02. පුනර්භවයක් ඇත යන්නට ඔබ එකඟ වන්නේ මන්ද යි පෙන්වා දෙන්න.

03. කුසල කර්ම හා අකුසල කර්ම වර්ග කරන්න.

## පැවරුම

1. අතීත භවය පිළිබඳ තොරතුරු සඳහන් කතා පුවත් රැස් කර කුඩා පොතක් පිළියෙල කරන්න.

සුළු වරද කෙරුමෙන
මහත් වැරදිත් වෙයි දන
සුළු වරද සුළු මෙන
සිතා නොගනින් මතු බලාගෙන

සිරිත් මල්දම